# වෙනස්වන සමාජය හමුවේ වැදි කාන්තාව හා සම්බන්ධ අවතරණ අවස්ථාවන් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

එම්.එස්.එම්. මාවතගේ[1]

යම් රටක ආදිතම ඉතිහාසයකට උරුමකම් කියන ජන කොටස එරට ආදිවාසීන් වේ. ශ්‍රී ලංකාවේ ආදිවාසීන් යනු වැදි ජනතාවයි. වැදි ජනතාව ස්වකීය අනන්‍යතාවය යම් දුරකට හෝ රැකගෙන වර්තමානයේ ජීවත්වන ජන කණ්ඩායමකි. මෙම අධ්‍යයනයේ ගැටළුව වශයෙන් ආදිවාසී කාන්තාවගේ ජීවිතයේ අවතරණ අවස්ථාවන්හි සිදුකළ චාරිත්‍ර නූතනයේත් එලෙසම පවතින්නේ ද? නැතහොත් සමාජ වෙනස්වීමේ ක්‍රියාවලිය තුළ ඒවා බිඳවැටී ඇත්දැයි අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙන්නානිගල වැදි ගම්මානය අධ්‍යයන ක්ෂේත්‍රය කරගනිමින් ද්විතීයික හා ප්‍රාථමික මූලාශ්‍රය භාවිතය තුළ ද්විතීයික දත්ත රැස් කිරීම පොතපත තුළින් ද ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා සිද්ධි අධ්‍යයනය හා සමීක්ෂණ ක්‍රම භාවිත කරන ලදි. එම ක්‍රම යටතේ දත්ත රැස්කිරීමේ ශිල්පීය ක්‍රමයන් වූ සහභාගීත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලී මගින් දත්ත ලබාගැනීමේ ක්‍රමවේදයන් වශයෙන් භාවිත කරන ලදි. ආදිවාසී කාන්තාවගේ අවතරණ අවස්ථාවන් යනු උපත, වැඩිවියට පත්වීම, විවාහය, ගර්භණී කාලය, දරු ප්‍රසූතිය යනාදියයි. අතීතයේදී ආදිවාසී කාන්තාව කිළි පැලක් තුළ දරුවා ප්‍රසූත කරනු ලබන අතර දින තුනකට පමණ පසුව මව සහ දරුවා ප්‍රධාන ගෘහයට ගෙන එනු ලැබේ. දරු ප්‍රසූතිය තෙක්ම ආදිවාසී කාන්තාව ගේ දොර වැඩවල නිරතවීමත් තලගොයි මස් හා කටු මිශ්‍ර හොද්දක් පානය කිරීමත් නිසා ප්‍රසූතිය ඇයට එතරම් අපහසු කාර්යක් නොවීය. ආදිවාසී දැරියගේ වැඩිවිය පැමිණීමේදී ද ගෙය අසලම ඇය වෙනුවෙන්ම සෑදූ කිළි පැලේ මල්වර දැරිය සහ තනියට කාන්තාවන් නවත්වා තබන අතර දින කීපයකින් පසු දැරියගේ නැන්දා හෝ නෑනා විසින් නුග ගසක් යටදී ඇයව නාවනු ලැබේ. එතැන් පටන් තරුණ වියේදී හා විවාහයෙන් පසුව ද මාසික ඔසප් සමයේදී එම කිළි පැල තුළ ඇය ගතකළ යුතුය. ආදිවාසී තරුණියගේ විවාහය ද අඩු වයසින්ම ඉතා සරළව සිදු කරනු ලැබේ. වැදි සමාජයේ නෑනා මස්සිනා විවාහ, ඒකපුරුෂ හා ඒකස්ත්‍රී විවාහ ක්‍රම වඩාත් පිළිගැනීමට ලක්වේ. විවාහය හා බැඳි ද්වාරකර්ම අවස්ථාවක් වශයෙන් විවාහයෙන් පසු නව දිවියට ප්‍රවේශ වීමට පෙර දෙදෙනා සාමාන්‍ය සමාජයෙන් ඈත්ව වනගත විය. වනගත වීමට පෙර තරුණයා තරුණියට රෙද්දක් ද, තරුණිය තරුණයාට දියලුණුවක් ද තෑගි දෙති. මරණයට ආදිවාසී කාන්තාව බියක් දැක්වූ අතර මරණයෙන් පසුව ආත්මය දින කීපයක් අවට සැරිසරන බව ඔවුන් විශ්වාස කරති. නූතන සමාජ වෙනස්වීම තුළ ආදිවාසී කාන්තාව හා සම්බන්ධ අවතරණ චාරිත්‍ර විධි වෙනස්වී ඇති බව හෙන්නානිගල කාන්තාව අධ්‍යයනය තුළින් සනාථ වේ. ඒ සඳහා සංස්කෘතික විසරණය, සංස්කෘතික සම්පර්කය, නවීකරණය ඍජුව හෝ වක්‍රව බලපා තිබේ.

ප්‍රමුඛ පද : අවතරණ අවස්ථාවන්, ආදිවාසී කාන්තාව, වැඩිවියට පත්වීම, විවාහය

---

[1] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය .shanikamadhumali857@gmail.com